**යටිනුවර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන.**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

--------------------------------

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

------------

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

--------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

------------------------

**පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** වැඩසටහන් පහක් යටතේ වැටුප් හා දීමනා වශයෙන් රු.**23,626,556** ක් වියදම් දරා ඇති අතර, ඒ සඳහා ලද රු.**17,756,306** ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල් එක් වැඩසටහනක් යටතේ පමණක් ගිණුම්ගත කර තිබුණි.

**(ආ)** ගබඩා ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී, තොග ගිණුමට ගිණුම්ගත නොකර සෘජුවම වියදමට හර කිරීම හේතුවෙන්, වර්ෂය අවසානයේ පොදු, ජල, විදුලි හා ඖෂධ යන ගබඩා අංශවල ඉතිරි ගබඩා ද්‍රව්‍ය තොග ගිණුම්ගත කර නොතිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂය තුළ දී ආයුර්වේද සඳහා ලද රු.**285,000** ක ආධාර ලැබීම් හා නිකුත් කිරීම් ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2** නොසැසඳූ පාලන ගිණුම්.

------------------------------

විවිධ ණයහිමි ශේෂයන්ගේ එකතුව රු.**1,855,553** ක් වූ අතර, උපලේඛන අනුව, ශේෂයන්ගේ එකතුව රු.**1,050,911** ක් වූයෙන්, රු.**804,642** ක නොසැසඳීමක් නිරීක්ෂණය වී තිබුණි.

**1.3.3** ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.

--------------------------------

**(අ)** ලැබියයුතු ගිණුම්.

--------------------

**2013** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.**63,163,154** ක් වූ අතර, එයින් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.**45,081,116** ක් වී තිබුණි.

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,863,488 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.9,191,616 ක් වියදම් ණයහිමියෝ වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.5,659,538 ක් වී තිබුණි. එම ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දිනට රු.5,015,100 ක් තවදුරටත් ගෙවියයුතුව පැවතුණි.**

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**-----------------------------------**

**අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතු වටිනාකම රු.5,735,860 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**----------------------------------------------**

**1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වගන්තියට අනුව, පරිසර බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර අතරින් ව්‍යාපාර 26 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා, සභාවට රු.104,000 ක ආදායමක් අහිමි වී තිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**---------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,619,226 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම**

**රු.20,344,401ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.16,274,825 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**-----------------------------------**

**සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.17,756,306 ක් ලැබී තිබුණු නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.23,626,556 ක් ගෙවා තිබුණි. ඒ අනුව, සභාවේ ආදායමෙන් රු.5,870,250 ක මුදලක් සේවකයින්ගේ වැටුප් ගෙවීමට වැය කර ඇති බව නිරික්ෂණය වන අතර, එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමෙන් සියයට 11 ක් වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**-----------------------------------**

**මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 6:1 වූ අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය වූ 7:1 ක ප්‍රශස්ත මට්ටමක නොපැවතින. සමස්ත ජංගම වත්කම්වලින් සියයට 49 ක් හෙවත්, මිලියන 50 ක් අය කර ගත හැකි උපයෝගීතා සේවා වූ අතර, එයින් ණයගැතියන් සියයට 45 ක් හෙවත්, මිලියන 46 ක මුදලක් විය. මුලු ජංගම වගකීම්වලින් සියයට 62 ක් හෙවත්, මිලියන 09 ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය.**

**-------------------------**

**2.4.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.**

**--------------------------------------------**

**සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මුළු හිග ආදායම රු.5,537,242 ක් විය.**

**2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**---------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.728,873 ක් හා මුද්දර ගාස්තු රු.4,535,746 ක් ලැබියයුතුව පැවතුණි. එම ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දිනට උසාවි දඩ රු.84,132 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.**

**2.4.3 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

**---------------------------**

**(අ) සම්ප්‍රේෂණ කුළුණු 11 ට අදාළ ලිපිගොනු සභාව සතුව පැවති අතර, කුළුණු 02 ක් සභාවේ අනුමැතිය ලබා නොගෙන අනවසරයෙන් ඉදි කර තිබුණි.**

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව, උස සෑම මීටර් 05 කටම රු.10,000 ක් බැගින් වූ ගාස්තු අය කළයුතු වුවද කාර්මික නිලධාරීන් මගින් පරීක්ෂාවන් සිදු කර අනවසරයෙන් ඉදි කර තිබූ කුළුණුවලට අදාළව ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.**

**(ඇ) සම්ප්‍රේෂණ කුළුණු 12 මගින් සන්නිවේදන පහසුකම් සපයා තිබූ සමාගම් අනුව, වාර්ෂික ව්‍යාපාර බදු අය කර ගතයුතු වුව ද, ඩයලොග්, ටෙලිකොම් සහ හච්සන් සමාගම් හැර අනෙකුත් සමාගම් මගින් ව්‍යාපාර බදු අය කර ගෙන නොතිබූ අතර, ඒවා ඉදි කිරීම සඳහා අනුකූලතා සහතික ද ලබා ගෙන නොතිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**------------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**----------------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**3.1.1** ජල මනු මිල දී ගැනීම.

--------------------------

**ජල යෝජනා ක්‍රමය සඳහා නිව් සෙන්ට්‍රල් හාර්ඩ්වෙයාර් වෙතින් 2013 ඔක්තෝබර් 29 දින කෙන්ට් ජල මනු 30 ක් එකක් රු.5,250 ක් බැගින් රු.157,500 කට මිල දී ගෙන තිබුණි. මෙම කාලය තුළ දීම එම වර්ගයෙන්ම කෙන්ට් ජල මනුවක් රු.4,700 ක් බැගින් උපුල් හාර්ඩ්වෙයාර් ස්ටෝර්ස් වෙතින් පාතදුම්බර ප්‍රාදේශීය සභාවටත් මිල දී ගෙන තිබුණි. මිල දී ගැනීමේ දී තාරගකාරීත්වයට හා පිරිමැසුම්දායකබව පිළිබඳ අවධානය යොමු නොකර මිල දී ගැනීම සිදු කිරීම නිසා, සභාවට එක් ජල මනුවක් සඳහා රු.550 ක් බැගික් රු.16,500 ක පාඩුවක් සිදු වී තිබුණි.**

**3.1.2 ඉඩම් කට්ටි කර විකිණීම.**

-----------------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

**i.** **අක්කර 02 රූඩ් 01 පර්චර්ස් 31.75 ක ප්‍රමාණයක් ඇති බවට මානක සැළැස්මක් ඉදිරිපත් කර තිබුණු බෝඅංග වලව්වත්ත, කුඩාඔය, පිළිමතලාව ලිපිනයේ පිහිටි "Green City" ඉඩම කට්ටි කර විකිණීම සඳහා සභා අනුමැතියක් ලබා ගෙන තිබුණි. නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුව හෙක්ටයාර් 01 ට වැඩි ඉඩම් කට්ටි කරන විට ඉඩමේ මාර්ග**

**හැර ඉතිරි බිම් ප්‍රමාණයෙන් 10% ක ප්‍රමාණයක් පොදු පහසුකම් සඳහා වෙන් කළයුතු වුව ද, පර්චර්ස් 06 ක බිම් ප්‍රමාණයක් අඩුවෙන් වෙන් කර ඇති බව මිනින්දෝරු සැළැස්මට අනුව නිරීක්ෂණය විය.**

**ii.** **ඉඩම් අනු බෙදීමට අදාළව අනුකූලතා සහතිකය ලබා ගෙන නොතිබුණි.**

**iii.** **2014 ජූලි 02 දින යථෝක්ත ඉඩම සම්බන්ධව සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී අනවසරයෙන් ගොඩනැගිල්ලක් ඉදි කරමින් පවතින බව අනාවරණය විය.**

**3.1.3 සේවක ණය.**

---------------

සභා සේවයෙන් විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් හතරදෙනෙකුගෙන් අය වියයුතුව ඇති රු.398,085 ක ණය මුදල් වසරකට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතින.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.**

----------------------------------------------------

රු.863,000 ක් වටිනා වාහන 08 ක් වසරකට වැඩි කාලයක් භාවිතයට ගෙන නොතිබූ අතර, මෙම වාහන ක්‍රියාකාරී තත්ත්වයට ගැනීමට හෝ ඉවත් කර ගිණුම් නිරවුල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

----------------------------------------

**4.1 ප්‍රසම්පාදන සැළැස්ම.**

------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු.**

--------------------------------------

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

--------------------------

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.4 අයවැය පාලනය.**

**------------------**

**සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අයවැය ලේඛනය හා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැසඳීමේ දි, ආදායම් විෂයයන් 07 ක සියයට 17 සිට සියයට 164 ක විචලනයක් දක්නට ලැබුණු අතර, වියදම් විෂයයන් 04 ක සියයට 22 සිට සියයට 95 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය මූල්‍ය පාලන ඒකකයන් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.**

**5. පද්ධති හා පාලන.**

**-----------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය.**

**(ආ) අයවැය පාලනය.**

**(ඇ) වත්කම් කළමනාකරණය**